# යාන් ඔය නිම්නයේ කොක්එබේ පූර්ව ඓතිහාසික ජනාවාසකරණය උදෙසා බලපෑ භූගෝලීය සාධක පිළිබඳ අධ්‍යයනයක්

## දීර්ඝ සාරාංශය

ඩී. එම්. නදීර හර්ෂජිත් දිසානායක[1]

### හැඳින්වීම

මිනිසාගේ ජීවනෝපාය තීරණය කිරීමෙහිලා ඈත අතීතයේ පටන් ම පරිසරය තීරණාත්මක සාධකයක් වූ බව අපි කවුරුත් දනිමු. ප්‍රාග් ඓතිහාසික අවධියේ පටන් එහි අඛුවැඩි ආකාරයේ මැදිහත්වීම පිළිබඳ විවිධ අධ්‍යයනයන් මඟින් හෙළි වේ. මානව අතීතයේ සුවිශේෂී සංධිස්ථානයක් වන පූර්ව ඓතිහාසික අවධීයේ දී මිනිසා හා පරිසරය අතර සංකීර්ණ සම්බන්ධතාවයක් හඳුනාගන්නට ලැබෙයි. යාන් ඔය නිම්නයට අදාළව මෙම අවධියට අයත් සාධක සහිත ස්ථාන 25කට වැඩි ප්‍රමාණයක් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෂ්ඨ කතිකාචාර්ය රංජිත් දිසානායක විසින් හඳුනාගෙන තිබේ. ඒ අතරින් 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශය විසින් කැණීම් කර ප්‍රකාශයට පත් කරන ලද කොක්එබේ මහාශිලා සුසානය ඉතා වැදගත් වේ.

### අරමුණු

මෙම අධ්‍යයනය මඟින් අපේක්ෂා කරනුයේ ක්‍රි.පූ. 800 පමණ කාලයක පටන් එම ප්‍රදේශය මානව ජනාවාසකරණයට ලක්වීම කෙරෙහි බලපෑ භූගෝලීය සාධකයන් හඳුනා ගැනීම ය.

### ක්‍රමවේදය

මෙහි අධ්‍යයන ක්‍රමවේදය ලෙස පූර්ව පර්යේෂණ අධ්‍යයනයක් හා ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රියාවලියක් මඟින් තොරතුරු පදනම් කර ගන්නා ලදී.

### ප්‍රතිඵල

අනුරාධපුර ඇතුල්නුවර කැනීමෙන් ලැබෙන සාධක අනුව වියළි කලාපයට අයත් පූර්ව ඓතිහාසික අවධියේ දත්තයන් ක්‍රි.පූ. 1000 දක්වා කාලයකට අයත් වෙයි. කොක්එබේ සාධක ක්‍රි.පූ. 800 පමණ කාලයකට කාලනිර්ණ වීමත් සමඟ මෙම ජනාවාසය ද අනුරාධපුරයට සමකාලීන වූ බව සිතිය හැකි ය. ඉන් පැහැදිලි වන්නේ ශිලා මෙවලම් භාවිතයෙන් ක්‍රමයෙන් මිදුණු මානවයා කෘෂිකර්මාන්තය ප්‍රමුඛ කරගත් යැපුම් රටාවකට නැඹුරු වන විට මෙම ගංගා නිම්න ඉතා වැදගත් වූ බවයි. වියළි කලාපීය පූර්ව ඓතිහාසික අවධියේ ජනාවාසය, මහාශිලා සුසාන සමූහයකට අමතරව ජලාශ්‍රිතව, ගංගා පිටාර තැන්නක, සරු පස හා පාෂාණ විහිදුමක් ආශ්‍රිතව විශේෂයෙන් ම හඳුනාගන්නට හැකි වේ (katugampola, 2015 129-134). විශේෂයෙන් ම කෘෂිකර්මාන්තය ඇතුළු එදිනෙදා ජල අවශ්‍යතා සඳහා ගංගා නිම්න ප්‍රදේශ ඔවුන් විසින් තෝරාගන්නට ඇත. කොක්එබේ ප්‍රදේශය අයත් වන්නේ ද යාන් ඔය මධ්‍ය නිම්න ප්‍රදේශයට ය. යාන් ඔය සිට මීටර් 500 පමණ වූ දුරකින් සුසාන භූමිය ස්ථාපිත වී ඇති අතර එය යාන් ඔය සාමාන්‍ය පිටාර සීමාවෙන් කෙළවර වේ. පූර්ව ඓතිහාසික අවධියේ මානව ජනාවාසය ලෙසින් සැලකිය හැකි, සුසානයට උතුරු දෙසින් ඇති අක්කර 20ක පමණ වූ භූමිය ද උස් බිමක හඳුනාගත හැකි ය.

කොක්එබේ ප්‍රදේශය අයත් වන්නේ විජයානු සංකීර්ණයට හා උස්බිම් සංකීර්ණයට අයත් වන අන්තර් භූ කලාපයට ය. මේ නිම්නය පුරා දැකිය හැක්කේ රතු දුඹුරු පස (Reddish Brown Soil) හා ඇලුවියල් පස (Alluvial Soil) වලිනි (මෙන්ඩිස්, 2016). ප්‍රාථමික කෘෂිකාර්මික ජන සමාජයක් මුල්බැස ගැනීම සඳහා මේ සාරවත් පරිසරය සෘජු සාධකයක් වන්නට ඇත. ඒ අනුව කොක්එබේ සුසානයත් යාන් ඔයත් අතර පිටාර තැන්න මුල් කෘෂිකාර්මික බිම් වූවාට සැක නැත.

එමෙන් ම කොක්එබේ ආශ්‍රිත ශේෂ කන්ද ජනාවාසකරණයට අවශ්‍ය සාධක සම්පූර්ණ කරන භූගෝලීය පිහිටීමකි. විශේෂයෙන් ම ඒ සඳහා සුසාන ඉදිකිරීම සඳහා අවශ්‍ය කරන පාෂාණ ලබා ගැනීමට ද කඳු නිසා හට ගන්නා සමෝච්ඡ විවිධතා වැදගත් වේ. එසේ හටගන්නා භූපතනයන්හි ඊසානදිග මෝසමෙන් ලැබෙන ජලය රැඳීම නිසා මානව ජල අවශ්‍යතාවය ද සපුරාලන ලදී. පසුකාලීනව වාරි නිර්මාණයක් කරා සංවර්ධනය වන්නේ මෙම සුවිශේෂී භූගෝලීය පිහිටීමයි.

මීට අමතරව සේරුවිල තඹ නිධියේ පිහිටීම ද එය අනුරාධපුර නාගරික පද්ධතිය කෙරෙහි බද්ධ වීමත් සමඟ ඇති වූ සම්පත් පරිවහනය ද මේ ජනාවාසකරණය කරා බලපෑම් කරන ලදී. කොක්එබේ ආශ්‍රිතව හමුවන පරහද නම් ඛනිජ සම්පත ද සුවිශේෂී පිහිටීමක් විය.

මේ අනුව බලන විට කොක්එබේ පූර්ව ඓතිහාසික ජනාවාසකරණය කෙරෙහි ප්‍රදේශය ආශ්‍රිත භූගෝලීය පිහිටීම සෘජු බලපෑමක් එල්ල කරන බව පැහැදිලි වෙයි.

### මූඛ්‍ය පද

පූර්ව ඓතිහාසික, කොක්එබේ, යාන්ඔය, භූගෝලීය, ජනාවාසකරණය

### ආශ්‍රිත මූලාශ්‍ර

Katugampola, M.(2015) Beyond What We Seeing: An Inter Site Spatial Pattern of

Megalithic Burial Complexes in *Yan Oya* Middle Basin (YOMB), Sri Lanka . International Journal of Culture and History, Vol. 1, No. 2, 129-134

මෙන්ඩිස්, ටී.ඩී. (2016) අවුරුදු 2800කට පෙර යාන්ඔය නිම්නයේ ජනාවාසකරණය. ඉරිදා. 25, සැප්තැම්බර්

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය , ශ්‍රී ලංකා ,රජරට විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව .